කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

2020 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

සිංහල

පුරාතන සිංහල සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය

SINH E - 1025

පළමුවන කොටසත් ,දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03.00 යි.

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

## I කොටස

01. (අ) පහත සඳහන් ඡේදය වත්මන් ලිහිල් බසින් ලියා අවස්ථා සම්බන්ධය පැහැදිලි කර දක්වන්න.

ඒ කුමාරයන් පලා යන්නා තමන්ගේ ඇඟ නබප්‍රහාර කොට තෙල් ගල්වා කිලුටු කඩක් ඇඳ ගෙන වැද හෙව,"රජ්ජුරුවන් වහන්සේ මා විචාළ සේක් වී නම් ලෙඩ ව වැද හෝනා සේකැ " යි කියව යි අන්තඃපුර වාසීන්ට උගන්වා වැද හොත්තාහ. රජ්ජුරුවෝත් නුවරට වැද නුවර ප්‍රදක්ෂිණා කොට රජ ගෙට වැද "බිසවුන් කොයිදැ"යි විචාළහ. අන්තඃපුරයේ ඇත්තෝ කියන්නාහු "ලෙඩ ව වැද හෝනා සේකැ"යි කීහ. රජ්ජුරුවොත් බිසවුන් ඉන්නා ගෙට ගොස් යාන පිට ඉඳ,"තොපට අඵාසු කිම් දැ" යි විචාළහ. බිසවු බැණ නොනැගී වැද හෙව කියන්නාහු "සස්වාමික කෙනෙක් වූ නම් මෙසේ ඉඳිමෝ ද, අපටත් ස්වාමි කෙනෙක් ඇද්ද ? නුඹ වහන්සේ ඇති නියාව දන්නේ දුටු විට ය"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඇයි තොපට ගහට කළෙෝ කවුරු දැ"යි කීහ.

ලකුණු 12 (08+04)

(ආ) පහත සඳහන් පද්‍යයන්හි අර්ථය වත්මන් ලිහිල් බසින් ලියා කතුවරයා සතු වර්ණනා චාතුර්යය සැකෙවින් අගයන්න.

වඩිමින් සවස නල හැසිරෙන දිගතුවල<br>
සොබමන් සුනිල් මිණි තිල් නුබ තුර විපුල<br>
පතසන් අවර ගිරි නැටියෙන් වැටෙන කල<br>
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

මහතුන් හසළ තම හට යස පිහිට ලෙස
නියතින් නො හළ යුතු බව පැමිණෙන වෙහෙස
සුදනන් පැවැති සිරිතැයි දන්වන විලස
නුබමින් සමග ගෙවෙනුය දහවල් දවස

සැදෑ ළෙන් වරුණ දෙව් රද මුහුද විසූ
සදෑ සහසකර එන මහවත සැලැසූ
විදෑ උපුල් පිළ මෙන් රත් පටින් වැසූ
සැදෑ වලා පෙළ පැළ දිග පෙනුණු පසු

උදුළ සොම් කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරි යහනැ නිකසළ
අතුළ කුසුම් විලයින් සැදෙන තුරු වැළ

ලකුණු 12 (08+04)

## II කොටස

02. සර්වකාලීන ජීවන අත්දැකීම් නිරූපණය කිරීමෙහි ලා ජාතකකථා රචකයා දැක්වූ කුසලතාව කෙබඳු දැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

03. සැළලිහිණි සන්දේශ කතුවරයාගේ වර්ණනා චාතුර්යය කෙබඳුදැයි සසාධකව පහදන්න.

04. "ගම්පොළ යුගය වනාහි සිංහල සාහිත්‍ය යුග අතර සන්ධිස්ථානයකි." මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

05. "සිංහල පද්‍ය සාහිත්‍යයෙහි දීප්තිමත් ම අවදිය කෝට්ටේ යුගයයි" . මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

## III කොටස

06. "මානව පරිණාමයේදී මිනිසා විසින් නිපදවා ගැනුණු විශිෂ්ටතම මෙවලම වන්නේ භාෂාවයි" . සාකච්ඡා කරන්න.

07. සිංහල භාෂාව කෙරෙහි විශේෂාවධානය යොමු කරමින් භාෂා ද්විරූපතාව පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් කරන්න.

08. උපභාෂා බිහි වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳව විශේෂාවධානය යොමු කරමින් සිංහල භාෂා සමාජයෙහි ව්‍යවහාර වන සමාජීය උපභාෂා පිළිබඳ විග්‍රහයක් කරන්න.

09. භාෂාව හා සංස්කෘතිය අතර ඇති සම්බන්ධය නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් යටතේ සටහන් ලියන්න.

i. උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය
ii. සරල වාක්‍ය
iii. අඝෝෂ ශබ්ද
iv. භාෂාවේ කාර්යභාරය
v. භාෂාව හා සමාජය

*************************************

(02 සිට 10 දක්වා පිළිතුරුවලට ලකුණු 19 බැගින් ප්‍රදානය කෙරේ)